

# නිසි මූල්‍ය කළමනාකරණය;
# පැහැබර අනාගතයකට මුල් පියවර

නේෂන්ස් ට්‍රස්ට් පාරිභෝගික ණය සේවාවේ අරමුණ ඔබගේ සිහින සැබෑකර දීම තුලින් ඔබට දීප්තිමත් අනාගතයක් උදාකර දීමයි. මේ ඒ සඳහා මූල්‍යමය වශයෙන් වැදගත් වන කරුණු කිහිපයකි.

### නිසි මූල්‍ය නම්‍යශීලීතාවය

ඔබට අනාගතයේදී දිනාගැනීමට ඇති සිහින හා අපේක්ෂාවන් බොහොමයි. එවන් අපේක්ෂාවන් දිනා ගැනීමට මූල්‍ය නම්‍යශීලීතාවය ඉතා වැදගත් වේ. නිසි මූල්‍ය නම්‍යශීලීතාවය ඔබේ දිවියේ විශේෂ අවස්ථාවන්ට මුහුණ දීමට අවශ්‍යය ශක්තිමත් ආර්ථික පසුබිමක් තනා දෙමින් ඔබගේ සිහින සැබෑ කරගැනීමට මඟ සලසයි.

### නිසි ණය කළමනාකරණය

සෑම විටම ඔබගේ ණය ගෙවීම් නියමිත වෙලාවට සිදුකරන්න. ඔබට දැරීමට අපහසු ලෙස ණය ගැනීමෙන් වළකින්න. මාසික ණය වාරික ගෙවීම අවම මට්ටමක පවත්වාගෙන යන්න. වෙනත් ආයතනයකින් අලුතින් ණය ලබා ගැනීමක් සිදුකරන්නේ නම් ඒ පිළිබඳව බැංකුව දැනුවත් කරන්න.

### ණය ශ්‍රේණිගත කිරීම හොඳ මට්ටමක පවත්වා ගන්න

සෑම විටම ඔබ විසින් යහපත් ණය කළමනාකරණයක් සිදු කරන්නේ නම් ඔබගේ ණය ශ්‍රේණිගත කිරීම හොඳ මට්ටමක පවත්වා ගත හැකි අතර එමගින් ඔබට අනාගතයේදී ද පහසුවෙන් මූල්‍ය පහසුකම් ලබා ගත හැකිය. එමෙන්ම, ඔබට දඩ මුදල් ගෙවීමට සිදුනොවන අතර අයහපත් CRIB වාර්තා තුලට ඇතුලත් වීමෙන් වැලකී සිටීම මගින් ඉහළ හා ගුණාත්මක සේවාවක් අප ආයතනය හෝ වෙනත් මූල්‍ය ආයතන මගින් ලබා ගැනීමේ හැකියාව උදාකරනු ඇත.

### අප සමග අදහස් හුවමාරු කරගන්න

ඔබගේ ඕනෑම මූල්‍ය ගැටලුවක් හෝ අපහසුතාවයක් පිළිබඳව සෑම විටම අප දැනුවත් කරන්න. ඔබට විවිධ වූ මූල්‍ය විසඳුම් ලබා දීම තුලින් යහපත් ණය ශ්‍රේණිගත කිරීමක් පවත්වාගෙන යාමේ අවස්ථාව අපට සලස්වා දිය හැකිය. ඔබගේ මූල්‍ය සැලසුම් හා මූල්‍ය තීරණ සඳහා අවශ්‍යය උපදේශනයන් ලබා දීමට අපගේ පළපුරුදු උපදේශකයින් නිරන්තරයෙන් සූදානමින් සිටින අතර එමගින් ඔබට හොඳම මූල්‍ය විසඳුම තෝරා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

customerservice@nationstrust.com

011 4 711 411

www.nationstrust.com

Nations TrustBank

නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී.එල්.සී – PQ118 | ෆිච් රේටිං A(lka)
නේෂන්ස් ට්‍රස්ට් බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණයට ලක් කරනු ලබන වාණිජ බැංකුවකි.